සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර 03 විභාගය - 2026 ජූලි

(3801) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2026-07-25
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
උත්තර ලිවීම සඳහා - පැය 03 යි.

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

A කොටස

(මුළු ලකුණු 20)

01 වන ප්‍රශ්නය

වාර්තාකරණ අස්තිත්වයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු මගින් එම අස්තිත්වය සතු ආර්ථික සම්පත් මත උපදවා ඇති ප්‍රතිලාභ පිළිබඳ තේරුම් ගැනීමට පරිශීලකයින්ට උපකාරී වේ. තවද, ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශනයන්හි සපයන ලද මූල්‍ය තොරතුරු සඳහා මෙන්ම වෙනත් ආකාරයන්ගෙන් සපයනු ලබන මූල්‍ය තොරතුරු සඳහාද අදාල වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට (Conceptual Framework) අනුව, ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණ දෙක(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිත කරනු ලබන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය (going concern assumption) **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

02 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) - තිරසාරභාවයට අදාල මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රමිත අංක 01 (SLFRS S1) මගින් විනිවිදභාවය, සැසඳිය හැකි බව සහ වගවීම සහතික කිරීම සඳහා තිරසරභාවයට අදාල මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීමට අදාල පොදු අවශ්‍යතා නියම කරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) තිරසාරත්ව වාර්තාවක් භාවිත කිරීමේ අරමුණක් **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) S1 හි, පොදු අවශ්‍යතා තුනක්(03) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

03 වන ප්‍රශ්නය

(a) ගිණුම්කරණ මෘදුකාංගයක් යනු පුද්ගලයින්ට සහ අස්තිත්වයන්ට වාර්තා කිරීමට, කළමනාකරණය කිරීමට සහ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමට උපකාරී වන මෙවලමකි.

ඔබ විසින් කළ යුතු දෑ:

ගිණුම්කරණ මෘදුකාංගයක කාර්යයන් දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(b) ක්‍රියාවලීන් විධිමත් කිරීම මගින් නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සහ උපාය මාර්ගික තීරණ ගැනීම සක්‍රිය කිරීම මගින් ස්වයංක්‍රියකරණය (automation), ගිණුම්කරණ ක්ෂේත්‍රය පරිවර්තනය කර තිබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

ගිණුම්කරණය සහ වාර්තාකරණය සඳහා ස්වයංක්‍රියකරණයෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

(මුළු ලකුණු 05)

04 වන ප්‍රශ්නය

1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත අනුව, විශේෂිත ව්‍යාපාර අස්තිත්වයන් [Specified Business Enterprises (SBEs)] විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කළ යුතුය.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත අනුව, විශේෂිත ව්‍යාපාර අස්තිත්වයන් වර්ග තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) මූල්‍ය වාර්තාකරණයේදී, ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීමේ වැදගත්කම් දෙකක්(02) **සඳහන් කරන්න.**

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 30)

05 වන ප්‍රශ්නය

සීමාසහිත Sun (පෞද්ගලික) සමාගමේ 2026 මාර්තු 31 දිනට සහ 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත Sun (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

මාර්තු 31 දිනට	2026	2025
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ	24,900	22,400
සමුච්චිත ක්ෂය	(5,400)	(4,200)
ධාරණ අගය	**19,500**	**18,200**
ජංගම වත්කම්:		
තොග	6,800	6,100
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	6,400	6,000
මුදල් සහ මුදල්වලට සමාන දෑ	2,100	1,900
	15,300	**14,000**
මුළු වත්කම්	**34,800**	**32,200**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	25,000	25,000
රඳවාගත් ඉපැයීම්	4,200	3,200
	29,200	**28,200**
ජංගම නොවන වගකීම්:		
දිගුකාලීන ණය	2,300	1,100
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම)	450	380
	2,750	**1,480**
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	1,900	1,620
ගෙවිය යුතු ආදායම් බදු	950	900
	2,850	**2,520**
මුළු ස්කන්ධය සහ වගකීම්	**34,800**	**32,200**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු පසු ලාභය රු.1,200,000/- ක් විය.

(2) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.450,000/- ක් විය.

(3) වර්ෂය තුළදී, පිරිවැය රු.4,000,000/- ක යන්ත්‍රයක් රු.1,800,000/- කට විකුණනු ලැබූ අතර, ඉවත්කළ දිනට එහි සමුච්චිත ක්ෂය වීම රු.1,900,000/- ක් විය. තවද, වර්ෂය තුළදී නව යන්ත්‍රයක් මිලට ගනු ලැබීය.

(4) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ණය මත පොළී වියදම රු.175,000/- ක් වූ අතර, වර්ෂය තුළදී සියළු පොළී ගෙවීම් සිදුකොට ඇත. වර්ෂය තුළදී ණය මත ප්‍රාග්ධන ආපසු ගෙවීම් සිදුකොට නොමැති අතර, අළුතෙන් ණය මුදලක් වර්ෂය තුළදී ලබාගෙන ඇත.

(5) වර්ෂය තුළදී පාරිතෝෂික ගෙවීම් රු.250,000/- ක් විය.

(6) 2026 මාර්තු 31 දින සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Sun (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

06 වන ප්‍රශ්නය

(A) 2025 අප්‍රේල් 01 දින, **සීමාසහිත Tech Solutions සමාගම** විසින් පාරිභෝගික අවශ්‍යතාවය පරිදි සකසන ලද මෘදුකාංග පැකේජයක් සහ ඊට අදාලව වර්ෂ 3 ක් සඳහා වන තාක්ෂණික සහාය සැපයීම සඳහා පාරිභෝගිකයෙකු සමඟ ගිවිසුමකට එළඹුණි. මෙහි මුළු ගිවිසුම්ගත මිල රු.3,000,000/- කි. මෙය වෙන් වෙන් වශයෙන් අලෙවි කරන්නේ නම්, මෘදුකාංගයේ විකුණුම් මිල රු.2,700,000/- ක් වන අතර සහ මාසික සහාය සේවා ගාස්තුව රු.25,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) - 15 අනුව, ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය අනුව, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සහ 2027 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඉහත ගනුදෙනුවෙන් ඇතිවන අයභාරය **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(B) **සීමාසහිත සිත්මා සමාගම,** පිරිවැය රු. මිලියන 60 ක් වූ ගොඩනැගිල්ලක් ඉදිකර තිබේ. ඉදිකිරීම් කටයුතු, 2025 ජූලි 01 දින ආරම්භ කළ අතර, 2026 මාර්තු 31 දින අවසන් කරන ලදී.

සමාගම පහත සඳහන් පරිදි ණය ගැනීම් සිදුකොට ඇත:

A ණය : 2025 අප්‍රේල් 01 දින, 10% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ විශේෂයෙන් මෙම ඉදිකිරීම සඳහාම රු. මිලියන 20 ක් ලබාගෙන ඇත.

B ණය : 2025 ජූලි 01 දින, 12% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 50 ක් පොදු ණය ගැනීම් ලෙස ලබාගෙන ඇත. ඉදිකිරීම් සඳහා දැරූ ඉතිරි මුදල, මෙම ණය මුදලින් භාවිත කරන ලදී.

2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී, මෙම ණය මුදල් භාවිත කරන තෙක් ගත් ණය මුදල් මත සිදුකළ ආයෝජන මඟින් රු.400,000/- ක පොලී ආදායමක් උපයාගෙන ඇත. ඉහත ණය මුදල් දෙකෙහි ප්‍රාග්ධන ආපසු ගෙවීම් 2026 අප්‍රේල් 01 දින සිට ආරම්භ කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) - 23 ණය ගැනුම් පිරිවැය අනුව, ගොඩනැගිල්ලේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනීත කළ යුතු ණය ගැනුම් පිරිවැය **ගණනය කරන්න.** (ලකුණු 05)
(මුළු ලකුණු 10)

07 වන ප්‍රශ්නය

(A) 2026 මාර්තු 31 දිනට, **සීමාසහිත P සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) දේපළ පිරියත සහ උපකරණවල විස්තර පහත පරිදි වේ: *(රු.'000)*

වත්කම්	**පිරිවැය**	**2026 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියා හල අගය)**	**2026 මාර්තු 31 දිනට බදු අරමුණු අනුව සමුච්චිත ක්ෂය වීම (ප්‍රාග්ධන දීමනාව)**
ඉඩම	120,000	120,000	-
මෝටර් වාහන	90,000	60,000	40,000

(2) 2026 මාර්තු 31 දිනට, පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.12,000,000/- කි.

(3) සමාගමට අදාල ආදායම් බදු අනුපාතය 30% කි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) 2026 මාර්තු 31 දිනට, තාවකාලික වෙනස්කම් (temporary differences) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) 2026 මාර්තු 31 දිනට, විලම්භිත බදු වත්කම / වගකීම **ගණනය කරන්න**. (ලකුණු 02)

(B) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Santa පොදු සමාගමේ** මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2026 ජුනි 10 දින අනුමැතිය ලබාදෙන ලදී.

පහත සඳහන් තොරතුරු **සීමාසහිත Santa පොදු සමාගමට** අදාල වේ:

(1) සමාගම, සෑම වර්ෂයකම එහි පරිචයක් [ප්‍රතිපත්තියක් (practice)] ලෙස සේවකයින්ට රු. මිලියන 8 ක් වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවනු ලැබේ. ඒ අනුව, 2026 අප්‍රේල් 05 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභයෙන් සේවකයින්ට රු. මිලියන 8 ක ප්‍රසාද දීමනා අනුමත කරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මේ පිළිබඳව සැළකිල්ලක් දක්වා නොමැත.

(2) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ තොග වංචාවක් සිදුව ඇති අතර, එය, ගබඩා කළමනාකරු විසින් සිදුකර ඇති බව 2026 මැයි 10 දින අනාවරණය විය. මෙම වංචාව හේතුවෙන් රු. මිලියන 7.5 ක අලාභයක් සිදුවී ඇති බවට ඇස්තමේන්තුගතකොට ඇති අතර, මෙම වංචාව නිසා තොගයේ වටිනාකම මෙම අගයෙන් වැඩියෙන් (overstated) සටහන් වී තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතය අනුව, ඉහත එක් එක් සිදුවීම්, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Santa පොදු සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 50)

08 වන ප්‍රශ්නය

සීමාසහිත Oceanic Cement පොදු සමාගමේ ගිණුම් පොත්වලින් 2026 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

සීමාසහිත Oceanic Cement පොදු සමාගම

2026 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම *(රු.'000)*

	හර	බැර
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 25,000,000)		250,000
2025 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම්		15,000
දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට:		
ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ පිරිවැය - රු. මිලියන 80)	140,000	
යන්ත්‍ර	90,000	
මෝටර් වාහන	22,000	
2025 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:		
ගොඩනැගිලි		14,000
යන්ත්‍ර		30,000
මෝටර් වාහන		2,000
වත්කම් ඉවත් කිරීමේ ගිණුම		2,000
2026 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට	95,000	
වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල්	88,000	33,000
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	19,357	
2025 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය		6,000
ගෙවූ ආදායම් බදු	7,500	
විකුණුම් පිරිවැය / විකුණුම්	520,000	720,000
2025 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු		6,500
වෙනත් ආදායම්		3,500
කල්බදු අත්තිකාරම් ගෙවීම්	2,543	
ගෙවූ අතුරු ලාභාංශ	12,000	
පරිපාලන වියදම්	51,600	
බෙදාහැරීමේ වියදම්	28,000	
මූල්‍ය සහ වෙනත් වියදම්	6,000	
	1,082,000	**1,082,000**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2026 මාර්තු 31 දිනට පැවති තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.91,400,000/- ක් විය.

(2) 2022 අප්‍රේල් 01 දින, රු.20,000,000/- ට මිලට ගත් යන්ත්‍රයක් 2026 මාර්තු 31 දින, රු.2,000,000/- කට විකුණන ලදී. යන්ත්‍රය විකිණීමෙන් ලද මුදල් "වත්කම් ඉවත්කිරීමේ ගිණුමට" බැරකොට ඇත. මුදල් ලැබීම වාර්තා කිරීම හැරුණුවිට, වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(3) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

ගොඩනැගිලි	:	වර්ෂ 40
යන්ත්‍ර	:	වර්ෂ 04
මෝටර් වාහන	:	වර්ෂ 05

(4) 2025 අප්‍රේල් 01 දින, මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ නව මෝටර් වාහනයක් මිලට ගන්නා ලදී. කල්බදු මෝටර් වාහනයේ සාධාරණ වටිනාකම රු. මිලියන 7 ක් වූ අතර, එහි කල්බදු කාලසීමාව වසර 5 කි. රු.1,543,000/- ක් වන වාර්ෂික කල්බදු වාරිකය සෑම වර්ෂයකම මාර්තු 31 දිනට ගෙවිය යුතු වේ. වාර්ෂික ව්‍යංග පොලී අනුපාතය 9% කි. කල්බදු කාලසීමාව අවසානයේදී, මෝටර් රථයේ හිමිකම **සීමාසහිත Oceanic Cement පොදු සමාගම** වෙත මාරු වේ. කල්බද්ද ආරම්භයේදීම සිදුකල රු. මිලියන 1 ක මූලික ගෙවීම සහ රු.1,543,000/- ක් වන පළමු කල්බදු වාරික මුදල, "කල්බදු අත්තිකාරම් ගෙවීම්" ගිණුම යටතේ සටහන් කර ඇත. මීට අමතරව, මේ සම්බන්ධ වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(5) සමාගමට රු.1,500,000/- ක මුදලක් ලැබිය යුතුව තිබූ ගනුදෙනුකරුවෙකු 2026 මැයි 20 දින බුන්වත්භාවයට පත්ව ඇති බව ප්‍රකාශ කරන ලදී. මේ වන විට මෙම මුදල අයකර ගතහැකි නොහැකි බවට තහවුරු වී ඇති අතර, එය බොල් ණයක් ලෙස ලියා හැරිය යුතුය. සමාගම මෙම ගනුදෙනුකරුවා සඳහා විශේෂ ප්‍රතිපාදනයක් ගිණුම් පොත්වල සිදුකර නොමැත. තවද, 2026 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා 10% ක ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

(6) 2024/25 තක්සේරු වර්ෂය සඳහා වන මුළු ආදායම් බදු වගකීම රු.6,500,000/- ක් වූ අතර, එය 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී ගෙවූ අතර, එම මුදල, "ගෙවූ ආදායම් බදු" ගිණුමට අයකොට ඇත. 2025/26 තක්සේරු වර්ෂය සඳහා වන මුළු ආදායම් බදු වගකීම රු.9,250,000/- ක් ලෙස ඇස්තමේන්තුගතකර ඇත.

(7) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන විගණන ගාස්තුව වන රු.250,000/- ගෙවා නොමැති අතර, එය ගිණුම් පොත්වල සටහන් තබා නොමැත.

(8) තවද, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ රු.125,000/- ක පොලී ආදායම, 2026 අප්‍රේල් 01 දින ලැබී ඇත.

(9) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2026 මැයි 31 දින ලබාදෙන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත Oceanic Cement පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2026 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

09 වන ප්‍රශ්නය

2026 මාර්තු 31 දිනෙන් සහ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා / අවසන් දිනට පහත සඳහන් තොරතුරු **සීමාසහිත Moon පොදු සමාගමෙන්** උපුටාගෙන ඇත:

(රු.'000)

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා	**2026**	**2025**
විකුණුම්	1,000,000	900,000
විකුණුම් පිරිවැය	(600,000)	(540,000)
දළ ලාභය	**400,000**	**360,000**
පොලී වියදම	(12,000)	(20,000)
ආදායම් බදු	(8,000)	(5,000)
බදු පසු ශුද්ධ ලාභය	**125,000**	**110,000**
මාර්තු 31 දිනට	**2026**	**2025**
තොගය	150,000	120,000
වෙළෙඳ ලැබිය යුතු මුදල්	200,000	180,000
මුදල් සහ මුදල්වලට සමාන දෑ	50,000	40,000
වෙනත් ජංගම වත්කම්	25,000	20,000
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	100,000	90,000
කෙටි කාලීන ණය	75,000	60,000
වෙනත් ජංගම වගකීම්	25,000	20,000

සියළුම විකුණුම් සහ ගැනුම් ණය පදනම මත සිදුකරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාතයන් **ගණනය කරන්න**:

(i) ජංගම අනුපාතය

(ii) දළ ලාභ අනුපාතය

(iii) ශුද්ධ ලාභ අනුපාතය.

(iv) තොග නේවාසික කාලය.

(v) ණයගැති එකතුකිරීමේ කාලය. (ලකුණු 05)

(b) **සීමාසහිත Moon පොදු සමාගම,** නියුතු අංශයට අදාල කර්මාන්ත සාමාන්‍ය අනුපාතයන් පහත දක්වා ඇත:

අනුපාතය	**කර්මාන්ත සාමාන්‍ය**
ජංගම අනුපාතය	1.80
දළ ලාභ අනුපාතය	35%
ශුද්ධ ලාභ අනුපාතය	15%
තොග නේවාසික කාලය	දින 75
ණයගැති එකතුකිරීමේ කාලය	දින 60

සීමාසහිත Moon පොදු සමාගමේ ඉහත සඳහන් අනුපාතයන්, කර්මාන්තයේ සාමාන්‍යයන් සමඟ සංසන්දනය කරමින් විචලතාවයන් සඳහා වියහැකි හේතු පැහැදිලි කරමින් සාරාංශ වාර්තාවක් **පිළියෙල කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

10 වන ප්‍රශ්නය

2025 අප්‍රේල් 01 දින, **සීමාසහිත Galaxy පොදු සමාගම, සීමාසහිත Star පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක්, රු. මිලියන 90 කට අත්පත් කරගන්නා ලදී.

සීමාසහිත Galaxy පොදු සමාගමේ සහ **සීමාසහිත Star පොදු සමාගමේ** 2026 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

2025 මාර්තු 31 දිනට	සීමාසහිත Galaxy පොදු සමාගම	සීමාසහිත Star පොදු සමාගම
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට	120,000	80,000
සීමාසහිත Star පොදු සමාගමේ සිදුකළ ආයෝජනය	90,000	-
ජංගම වත්කම්:		
තොග	18,000	22,000
වෙළෙඳ ලැබිය යුතු මුදල්	24,000	14,000
සීමාසහිත Galaxy පොදු සමාගමෙන් ලැබිය යුතු මුදල්	-	5,000
මුදල් සහ මුදල්වලට සමාන දෑ	18,500	2,500
	60,500	43,500
මුළු වත්කම්	**270,500**	**123,500**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	150,000	60,000
රඳවාගත් ඉපැයීම්	30,000	12,000
මුළු ස්කන්ධය	**180,000**	**72,000**
ජංගම නොවන වගකීම්:		
දිගුකාලීන ණය	46,000	33,500
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	35,000	17,000
සීමාසහිත Star පොදු සමාගමට ගෙවිය යුතු මුදල්	3,000	-
ගෙවිය යුතු ආදායම් බදු	6,500	1,000
	44,500	18,000
මුළු ස්කන්ධය සහ වගකීම්	**270,500**	**123,500**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අත්පත් කරගත් දිනට, **සීමාසහිත Star පොදු සමාගමේ** ඉඩම හැර, ශුද්ධ වත්කම්වල පොත් අගය මගින් ඒවායේ සාධාරණ අගය නිරූපණය වේ. එදිනට ඉඩමේ සාධාරණ අගය සහ ධාරණ අගය (පොත් අගය) පිළිවෙලින් රු. මිලියන 75 ක් සහ රු. මිලියන 68 ක් විය.

(2) අත්පත් කරගත් දිනට පාලනය නොවන හිමිකමෙහි [Non-Controlling Interest (NCI)] සාධාරණ අගය රු. මිලියන 18 ක් විය. අත්පත් කරගත් දිනට, **සීමාසහිත Star පොදු සමාගමේ** රඳවාගත් ඉපැයීම් රු. මිලියන 10 ක් විය.

(3) 2026 මාර්තු 21 දින, **සීමාසහිත Star පොදු සමාගම** විසින් රු. මිලියන 2 ක් වටිනා භාණ්ඩ **සීමාසහිත Galaxy පොදු සමාගමට** විකුණන ලදී. **සීමාසහිත Star පොදු සමාගම,** පිරිවැය මත 25% ක ලාභයක් තබා ගනී. 2026 මාර්තු 31 දිනට, **සීමාසහිත Galaxy පොදු සමාගම** වෙත මෙම තොගය ලැබී නොතිබූ අතර, "**සීමාසහිත Galaxy පොදු සමාගමෙන්** ලැබිය යුතු මුදල්" සහ "**සීමාසහිත Star පොදු සමාගමට** ගෙවිය යුතු මුදල්" අතර ඇති වෙනස මෙම කාල වෙනස්කම නිරූපණය කරයි.

(4) 2026 මාර්තු 31 දින හානිකරණ පරීක්ෂාවක් සිදුකළ අතර, එහිදී **සීමාසහිත Star පොදු සමාගම** අත්පත් කරගැනීම මත ඇතිවූ කීර්තිනාමය රු. මිලියන 7 කින් හානිකරණය වී ඇති බව අනාවරණය විය.

(5) 2026 මාර්තු 31 දින, **සීමාසහිත Galaxy පොදු සමාගම** විසින් රු. මිලියන 10 කට මිලට ගන්නා ලද ඉඩමක් රු. මිලියන 15 කට **සීමාසහිත Star පොදු සමාගම** වෙත විකුණා ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) **සීමාසහිත Star පොදු සමාගම** අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) 2026 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 11)

(මුළු ලකුණු 15)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව			
මට්ටම	**ක්‍රියා ලැයිස්තුව**	**නිර්වචනය**	**සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්**
මතක තබා ගැනීම කරුණු,පද, මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ	හඳුනා දක්වන්න	කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම.	මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න.
	නිර්වචනය කරන්න	වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම.	පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම.
	හඳුනා ගන්න	පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය.	පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම.
	සඳහන් කරන්න	පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම.	ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකාශ කිරීම.
	ලැයිස්තුගත කරන්න	නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්.	ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම.
	සටහන් කරන්න	පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම.	අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම.
අවබෝධය තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම.	ගොඩ නගන්න	මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම.	විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම.
	වෙනස් කොට දක්වන්න	දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම.	සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම.
	විමසන්න	මාතෘකාවක් පිළිබඳව විවිධ අදහස් සහ මත සලකා බැලීම.	විවිධ දෘෂ්ටිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම.
	පැහැදිලි කරන්න	යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම.	තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම.
	ගෙනහැර දක්වන්න	කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය.	සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම.
	අර්ථකථනය කරන්න	තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම.	යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම.
	විස්තර කරන්න	යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්.	අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම.
	සාරාංශගත කරන්න	ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්.	සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම.
භාවිතය අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ.	භාවිත කරන්න.	යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම.	ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම.
	ගණනය කරන්න.	ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම.	විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම.
	තීරණය කරන්න	පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම.	ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම.
	ප්‍රදර්ශනය කරන්න.	ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම.	ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම.
	පිළියෙල කරන්න.	භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම.	කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම.
	භාවිත කරන්න	සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම.	අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම.
	ඉදිරිපත් කරන්න.	සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම.	මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම.
විශ්ලේෂණය ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම	විශ්ලේෂණය කරන්න	සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම.	වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම.
	සසඳන්න	සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම.	ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම.
	වෙනස්කොට දක්වන්න	යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම.	යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම.
	පරීක්ෂා කරන්න	යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම.	යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම.
	සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.	ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම.
	ක්‍රියා කරන්න	අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම.	කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම.
	වාර්තා කරන්න	සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම.	විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම.
අගය කරන්න නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම.	උපදෙස් දෙන්න	යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම	විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම.
	අගය කරන්න	වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම.	නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම.
	සකස් කරන්න	ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම.	හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම.
	නිර්දේශ කරන්න	සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම.	තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම.
නිර්මාණය කිරීම සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව	නිර්මාණය කරන්න	අළුත් දෙයක් නිර්මාණය කිරීම.	අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම.
	තක්සේරු කරන්න	ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම.	පවතින තොරතුරු මත පදනම්ව තර්කානුකූල විනිශ්චයන් ලබා දීම.
	සංවර්ධනය කරන්න	අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම.	කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම.
	යෝජනා කරන්න	සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම.	අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම.
	සංයෝජනය කරන්න	විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම.	විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම.
	සැලසුම් කරන්න	යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම.	නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම.
	ගොනු කරන්න	විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම.	එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම.